# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 33 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ ශත : 60 යි | තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 33 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 23 වන දින.]

එල්.ඩී.—ඕ. 4/85

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1985 අංක 33 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් තමා සේවය කළ කාලය තුළ දී මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති යම් ධුරයක්, මුළුමනින් අවුරුදු පහක් වූ අවම කාලයක් දරා ඇති යම් තැනැත්තෙක්, ඒ ධුරය දරන්නාට දනට ගෙවනු ලබන මූලික වැටුපෙන් තුනෙන් පංගුවක් වන්නා වූ විශ්‍රාම වැටුපක් ද ඔහු මුළුමනින් අවුරුදු පහළොවක කාලයක් හෝ ඊට වැඩි කාලයක් ඒ ධුරය දරා ඇත්නම් එකී මූලික වැටුපෙන් උපරිම වශයෙන් තුනෙන් දෙපංගුවක් වන්නා වූ විශ්‍රාම වැටුපක් ද මාසිකව ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නේ ය:

එසේ වුවද ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් තමා සේවය කළ කාලය තුළ දී, මේ පනතේ උපලේඛන යෙහි දක්වා ඇති යම් ධුරයක්, අවුරුදු පහකට වැඩි වුවත් අවුරුදු පහළොවකට අඩු වන්නා වූ කාලයක් දරා ඇති යම් තැනැත්තෙක් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කථානායකවරයා විසින් පිළියෙල කරනු ලබන ගෙවීමේ චක්‍රයකට අනුකූලව නිශ්චය කරනු ලබන ප්‍රමාණානුකූල මාසික විශ්‍රාම වැටුපක් ලැබිය යුතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි "මේ පනත යටතේ ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් ලබන" යන වචන වෙනුවට "මේ පනත යටතේ ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් ලබන්නා වූ ද, ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුගේ වැන්දඹුව වීමේ හේතුවෙන් ඒ විශ්‍රාම වැටුප ලබන තැනැත්තකු නොවන්නා වූ ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ඒ 084778—6,900 (85/07)

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් තැනැත්තකු" යන වචන වෙනුවට "(3) වන සහ (4) වන උපවගන්ති වලට යටත්ව, යම් තැනැත්තකු" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත් දැක්වේන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(3) මේ උපවගන්තිය බලාත්මක වන දිනයේ දී, 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලබන සෑම තැනැත්තකුම, මේ උප වගන්තිය බලාත්මක වන දින සිට මාස තුනක් ඇතුළත තමාට කිනම් විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතුදැයි තෝරා ගත යුතු අතර, ඒ තෝරා ගැනීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ඔහු විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) මේ උපවගන්තිය බලාත්මක වන දිනයෙන් පසුව, 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උප වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලබන සෑම තැනැත්තකු ම, ඒ උපවගන්ති දෙකම යටතේ විශ්‍රාම වැටුප් ගෙවනු ලැබීමට හිමිකම ලැබූ අවස්ථාවේ සිට මාස තුනක් ඇතුළත තමාට කිනම් විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතුදැයි, තෝරාගත යුතු අතර, ඒ තෝරා ගැනීම, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ඔහු විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ කරන ලද සෑම තෝරා ගැනීමක් ම, ඒ උප වගන්ති දෙකෙන් කවර හෝ උපවගන්තියක් යටතේ තෝරා ගැනීමක් කිරීමෙන් පසු මේ පනතේ උපලේඛන යෙහි දක්වා ඇති ධුරයක් දරන්නකු බවට පත්වීමේ හේතු වෙන්, ඒ තෝරා ගැනීම සිදු කළ දිනයෙන් පසු, වැඩි අනුප්‍රමාණයක් මත ආගණනය කරන ලද විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු සම්බන්ධ යෙන් වන විට හැර, අවසානාත්මක විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය, මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 7ඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"රජයේ නිලධරයන්ට විශ්‍රාම වැටුප් මත ඈනට ගෙවනු ලබන දීමනා විශ්‍රාම වැටුපට ඇතුළත් විය යුතු බව.

7ඇ. මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලබන යම් තැනැත්තෙක් ඒ විශ්‍රාම වැටුපට අමතරව, රජයේ නිලධරයන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් මත ඈනට ගෙවනු ලබන සියලු දීමනා ද ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නේ ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තිය අගට පහත දැක්වෙන උපලේඛනය ඇතුළත් කිරීමෙන්, ඒ ප්‍රඥප්තිය මේයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් උපලේඛනයක් ඇතුළත් කිරීම.

" උපලේඛනය [4 (2) වන වගන්තිය]

අග්‍රාමාත්‍ය ;

කථානායක ;

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍ය ;

විරුද්ධ පක්ෂයේ නායක ;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍ය ;

නියෝජ්‍ය අමාත්‍ය ;

නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ;

නියෝජ්‍ය කාරක සභාපති. ".